## නිවැරදි පිළිතුර තෝරන්න.

01. ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා උදාහරණ වලට අයත් කාණ්ඩය වනුයේ,

I. ජයසිකුරු ක්‍රීඩා සමාජය, පියල් ව්‍යාපාරය, ශිල්ප පාඨක සමාජය, සරණ සුභසාධක සමිතිය

II. රත්තරු ක්‍රීඩා සමාජය, ශිල්ප පාඨක සමාජය, දෙමළ සාහිත්‍ය සංගමය, රත්නගේ ව්‍යාපාරය

III. සරණ සුභසාධක සමිතිය, රත්තරු ක්‍රීඩා සමාජය, තරිඳුගේ ව්‍යාපාරය, ග්‍රාම සංවර්ධන සමිතිය

IV. සරණ සුභසාධක සමිතිය, රත්තරු ක්‍රීඩා සමාජය, වාණිජ සංගමය, ග්‍රාම සංවර්ධන සමිතිය.

02. ලාභ අරමුණු කර නොගත් සංවිධාන පිළියෙළ කරනු ලබන ප්‍රධාන ගිණුම් වර්ගයක් වනුයේ,

I. ආදායම් ප්‍රකාශය

II. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

III. ලාභ හෝ අලාභ ප්‍රකාශය

IV. පිරිවැය ලේඛනය

LIVEWORKSHEETS

03. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර විසින් පිළියෙල කරනු ලබන "ලැබීම් හා ගෙවීම් ගිණුම" සමානකමක් දක්වන්න.

I. විකුණුම් ගිණුමටය

II. ප්‍රාග්ධන ගිණුමය

III. මුදල් පොතටය

IV. බැංකු ගිණුමටය

04. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියෙළ කරනු ලබන ආදායම් ප්‍රකාශය සම්බන්ධයෙන් නොගැලපෙන වාක්‍ය තෝරන්න.

I. ආදායම් හා වියදම් පමණක් ඇතුළත් කරයි

II. අවසාන ශේෂයෙන් අතිරික්තය හෝ ඌනතාවයක් පෙන්නුම් කරයි.

III. මුදල් පදනමට පිළියෙල කරයි

IV. උපචිත පදනමට පිළියෙල කරයි

LIVEWORKSHEETS

05. ලාභ අරමුණු කරගත් ව්‍යාපාරවල ලාභාලාභ ගිණුමට සමානව ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර වල පිළියෙළ කරනුයේ,

I. මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

II. ආදායම් ප්‍රකාශය

III. ලාභ හෝ අලාභ ප්‍රකාශය

IV. ලැබීම් හා ගෙවීම් ගිණුම

06. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියෙල කරන ආදායම් ප්‍රකාශයෙන් ලබාගත හැකි තොරතුරකි.

I. ශුද්ධ ලාභය

II. ලාභාන්තිකය

III. අතිරික්තය

IV. ශුද්ධ අලාභය

07. ලාභ අරමුණු කර නොගත් සංවිධාන වල මූල්‍ය ප්‍රකාශයන් සැකසීමට අදාළව පහත සඳහන් තොරතුරු ගැලපෙනසේ සසඳන්න.

LIVEWORKSHEETS

1. වියදමට වඩා වැඩි ආදායම
A. ආදායම් ප්‍රකාශනය
2. ආදායමට වඩා වැඩි වියදමින්
B. අතිරික්තය
3. වර්ෂයට අදාළව ලැබිය යුතු මුළු සාමාජික මුදල
C. ලැබීම් හා ගෙවීම් ගිණුම
4. වර්ෂයට අදාලව ලැබූ සාමාජික මුදල
D. ඌනතාව

I. B , D , C , A

II. B , C , D , A

III. D , C , B , A

IV. D , B , C , A

**පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 8, 9 හා 10 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

සරණ සුභ සාධක සමිතියේ සාමාජික සංඛ්‍යාව 75 දෙනෙකු වන අතර, වාර්ෂික සාමාජික ගාස්තුව රුපියල් 600.00 කි. වර්ෂ අවසානය වන විට සාමාජිකයන් 15 ක් හැර ඉතිරි සියලුම සාමාජිකයින් මුදල් ගෙවා අවසන් කර තිබුණි. එසේම වර්ෂ අවසාන විදුලි බිල වූ රුපියල් 5000.00 න් ගෙවා තිබුණේ රුපියල් 3000.00 ක් පමණි.

08. සරණ සුබසාධක සමිතියේ ආදායම් ප්‍රකාශයේ සාමාජික මුදල් ලැබීම් ලෙස සටහන් කළ යුත්තේ,

LIVEWORKSHEETS

I. රුපියල් 45000.00 කි

II. රුපියල් 60000.00 කි

III. රුපියල් 9000.00 කි

IV. රුපියල් 36000.00 කි

09. මෙම සමිතියේ "ලැබීම් හා ගෙවීම් ගිණුමේ" සටහන් කළ යුතු විදුලි වියදම් වටිනාකම වනුයේ,

I. රුපියල් 5000.00 කි

II. රුපියල් 2000.00 කි

III. රුපියල් 3000.00 කි

IV. රුපියල් 7000.00 කි

10. මෙම සමිතියේ මුදල් නොගෙවූ සාමාජිකයන් පහළොස් දෙනාගේ සාමාජික මුදල් සලකන්නේ,

I. උපචිත ආදායම් ලෙසය

II. උපචිත වියදම් ලෙසය

LIVEWORKSHEETS

III. පෙර ගෙවුම් ලෙසය

IV. පෙර ලැබීම් ලෙසය

LIVEWORKSHEETS